ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date. } 2020.08.11

එස්.ඒ.බාබු මහතා,
අංක 63, කිරියගොල්ල,
හාලිඇල.

පැමිණිලි පාර්ශවය

01. ප්‍ර.පො.ප. ධනංජය පෙරමුණ මහතා,
ස්ථානාධිපති, පොලිස් ස්ථානය,
වාලච්චේන.

02. පො.කො. 36147 කාවින්ද මහතා,
පොලිස් ස්ථානය, වාලච්චේන.

03. පො.කො. 61212 කුමාර මහතා,
පොලිස් ස්ථානය, වාලච්චේන.

04. පො.සැ. 19433 උපාලි මහතා,
පොලිස් ස්ථානය, වාලච්චේන.

05. පො.කො. 60181 ආනන්ද මහතා,
පොලිස් ස්ථානය, බුත්තල.

වගඋත්තරකාර පාර්ශවය

*පැමිණිලි අංකය : **HRC/39/17***

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, ගල්කිස්ස පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් 5 දෙනෙක් විසින් 2016.12.31 වන දින දහවල් 2.00 ට පමණ පැමිණිලිකරු රියදුරෙක් වශයෙන් සේවය කරමින් සිටි අයේෂා සේනානායක නමැති අයගේ නිවසේ දී අත්අඩංගුවට ගත් බවයි. පසුව පොලිස් නිලධාරීන් විසින් තමන්ව ගල්කිස්ස දුම්රිය පොල අසල පාළු නිවසකට රැගෙන ගිය බවත්, එම නිවසේදී අත් බැඳ නිරුවත් කොට දැඩි ලෙස පහරදී වධහිංසා කළ බවත්, පසුව සවස 6.30 – 7.00 ත් අතරතුර පොලිස් ස්ථානයට රැගෙන ගොස් පැමිණිලිකරු සේවය කළ නිවසේ මංකොල්ලයක් සම්බන්ධයෙන් ප්‍රශ්ණ කොට කටඋත්තරයක් ලබාගත් බවයි.

ඉන් අනතුරුව 2017.01.01 දින කළුබෝවිල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්, එම අවස්ථාවේදී අධිකරණ වෛද්‍යවරයා පැමිණිලිකරුව ප්‍රතිකාර සඳහා රෝහල් ගත කරන ලෙසට දැනුම්දීමෙන් පසු 2017.01.17 දින දක්වා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත්ය. රෝහල් ගතව සිටියදී මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරුට ඇප නියම කර 2017.01.11 දින නැවත අධිකරණයට ඉදිරිපත් වන ලෙසට දැනුම් දුන් බවත්, ඒ අනුව නියමිත දිනයේදී අධිකරණයට ඉදිරිපත් වීමෙන් පසු අදාළ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

මංකොල්ලයට සම්බන්ධ සැකකරුවන් අතුරුගිරිය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව දැනගන්නට ලැබුනු බවයි.

වගඋත්තරකරුවන්ගේ ඉහත ක්‍රියාකලාපය හේතුවෙන් තමාට දැඩි අසාධාරණයක් සිදු වූ බවත්, ඒ සම්බන්ධයෙන් තමා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ද පොලිස් මූලස්ථානය වෙත ද පැමිණිලි කරන ලද බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

<u>1 වන වගඋත්තරකාර ප්‍ර.පො.ප. ධනංජය පෙරමුණ යන අයගේ කරුණු දැක්වීම :</u>

ප්‍ර.පො.ප. ධනංජය පෙරමුණ යන අය ප්‍රකාශ කර සිටින්නේ, තමන් 2016 වර්ෂයේ ගල්කිස්ස පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ බවත්, එම කාල වකවානුවේදී එනම්, 2016.12.31 වන දින අංක : 1/ඒ, සල්මල් පෙදෙස, සිරිමල් උයන, රත්මලාන ලිපිනයේ පදිංචි අයේෂා දමයන්ති සේනාරත්න යන අය විසින් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කරමින්, බුද්ධි අංශ නිලධාරින් යැයි කියමින් පිරිසක් ඇයගේ නිවසට පැමිණ ඇයට හා නිවසේ අයට පහරදී අවි පෙන්වා බිය ගන්වා මුදල් සහ රන් අභරණ කොල්ල කෑමක් සිදු කරන ලද බවට සඳහන් කරන ලද බවයි. ඒ අනුව මෙම පැමිණිල්ල බල අපරාධ 617/16 යටතේ ලේඛන ගත කර වැඩිදුර විමර්ශනය සිදුකළ බවත්, එහිදී නිවසේ රියදුරා ලෙස සේවය කළ සෙල්ලයියා ආනන්ද බාබු යන අය සම්බන්ධයෙන් සැකයක් පවතින බවට පැමිණිලිකාරිය වාචිකව දැනුම්දීම මත ඔහුව අත්අඩංගුවට ගන ස්ථානයට ඉදිරිපත් කළ බවත්, එම අයව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී මොහුව පරීක්ෂා කිරීමේදී මුහුනේ සියුම් සීරීම් සලකුණු නිරීක්ෂණය වූ බැවින්, ඒ සම්බන්ධයෙන් අදාළ සටහන් යෙදූ බවත්, එදිනම අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කිරීමෙන් පසුව බී අංක 2/17 යටතේ අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු මහේස්ත්‍රාත්වරයා රෝහල වෙත ගොස් මෙම සැකකරුව පරීක්ෂා කළ බවත්, 2017.01.11 වන දින අධිකරණයේ පෙනීසිටින ලෙසට නියෝග කර රු. ලක්ෂ 15 ක පුද්ගල ඇපයක් මත මුදාහැර ඇති බවත්ය.

තමන් හෝ තමන්ගේ නිලධාරින් කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත්, අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රශ්ණ කර කරුණු අනාවරණය කර ගැනීමට උත්සහ කළ බවත්, මෙම සැකකරුගේ ජංගම දුරකථනය සම්බන්ධයෙන් විශ්ලේෂණ වාර්තා ලබාගැනීමට කටයුතු කළ බවත්, එම විශ්ලේෂණ වාර්තා වලට අනුව මෙම මංකොල්ලයට මෙම අය සම්බන්ධ නොවූ බවට කරුණු අනාවරණය වීමෙන් පසුව ඒ පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු අධිකරණය මඟින් මෙම අයව මුදා හරින ලද බවත්ය.

පහරදීම සම්බන්ධයෙන් තමා වෙත එල්ල කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, එම චෝදනා අසත්‍ය බවත්, අදාළ විමර්ශනය සිදුකරන ලද්දේ සත්භාවයෙන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>2 වන වගඋත්තරකාර පො.කො. 36147 කාවින්ද යන අය මියගොස් ඇත.</u>

<u>3 වන වගඋත්තරකාර පො.කො. 61212 ඩබ්ලිව්.ජී.ජේ.පී.කුමාර යන අයගේ කරුණු දැක්වීම :</u>

පො.කො. 61212 ඩබ්ලිව්.ජී.ජේ.පී.කුමාර යන අය ප්‍රකාශ කර සිටින්නේ, සිද්ධියට අදාළ දිනය වනවිට තමා ගල්කිස්ස පොලිස් ස්ථානයේ අපරාධ අංශයට අනුයුක්තව සේවය කළ බවත්, 2016.12.31 වන දින අපරාධ අංශයට ලැබී තිබූ පැමිණිල්ලකට අනුව ආනන්ද බාබු යන අයව අත්අඩංගුවට ගැනීමට අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා සමඟ සහභාගි වූ බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෝ අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන අවස්ථාවේදී හෝ ඉන්පසුව හෝ කිසිදු පහරදීමක් නොකළ බවත්, අත්අඩංගුවට ගෙන ප්‍රශ්ණ කිරීමේදී පරස්පර ප්‍රකාශ කිරීම හේතුවෙන් මොහු සම්බන්ධයෙන් සැක මතු වූ බවත්ය.

<u>4 වන වගඋත්තරකාර පො.සැ. 19433 එම්.ඩී.උපාලි යන අයගේ කරුණු දැක්වීම :</u>

4 වන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, 2016.12.31 වන දින අපරාධ අංශයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරින් සමඟ WP GB 8451 දරණ රථයෙන් මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට පිටව ගිය

බවත්, තමා විසින් රථය පදවාගෙන ගිය බවත්ය. පසුව අනෙක් නිලධාරින් ගොස් මෙම සැකකරුව අත්අඩංගුවට ගත් බවත්, තමා සැකකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවට සහභාගි නොවූ බවත්, මෙම අයගෙන් ප්‍රශ්ණ කිරීම හෝ වෙනත් ආකාරයක රාජකාරි කටයුත්තක නොයෙදුනු බවත්ය. එහෙත් මෙම සැකකරු පසුදින 11.00 ට පමණ කළුබෝවිල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්, එයට තමා සහභාගි වූ බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත්ය.

<u>5 වන වගඋත්තරකාර පො.කො.60181 ආර්.එම්.ආනන්ද යන අයගේ කරුණු දැක්වීම :</u>

පො.කො. 60181 ආර්.එම්.ආනන්ද යන අය ප්‍රකාශ කර සිටින්නේ, මෙම සැකකරුව අත්අඩංගුවට ගැනීමට හෝ ඒ සම්බන්ධ විමර්ශනයකට තමා සම්බන්ධ නොවූ බවත්, එහෙත් සැකකරුව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්, අදාළ චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත්ය.

**පැමිණිල්ලට අදාළව ඉදිරිපත් වී ඇති සාක්ෂි :**

කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, අධිකරණ වෛද්‍ය පෝරම අංක 02/17 යටතේ කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් මෙම අයව පරීක්ෂා කර ඇත. එකී අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට සඳහන් වී ඇත.

**නිරීක්ෂණ :**

අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට දැක්වෙන අතර, රෝගියා විසින් වෛද්‍යවරයාට රෝගියාගේ ඉතිහාසය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කර ඇති අතර, එම ප්‍රකාශයේදී අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා, කුමාර සහ ආනන්ද යන නිලධාරින් පහරදුන් බවත්, මුහුණට හා පිටට පහරදුන් බවත්, අත පිටුපසට කොට බැද දැමූ බවත්, රැවුල ඇඳ ගැලවූ බවත්, අත් දෙක ගැට ගසා එල්ලූ බවත්, නහයට මිරිස් ඇල්ලූ බවත් සඳහන් කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල වල ස්වභාවයෙහි දක්වා ඇත්තේ මුහුණ දෙපැත්ත ඉදිමී ඇති බවත්, නමුත් දත් වලට හානි සිදුවී නොමැති බවයි. වම් අතේ මාපට ඇඟිල්ලේ මුල් කොටස ඉදිමී ඇති බවත්, බඩ පෙදෙසේ ද වේදනාවක් ඇති බවත් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන්ව ඇති බව නිරීක්ෂණය වේ.

පොලිසිය විසින් මෙම සැකකරුව අත්අඩංගුවට ගෙන ප්‍රශ්ණ කිරීමේදී සැකයක් මතු වූ බවට දක්වා ඇති අතර, සිදුකරන ලද විමර්ශන වලදී පැමිණිලිකරු මෙම අපරාධයට සම්බන්ධ නොමැති බවට අනාවරණය වූ බැවින්, පැමිණිලිකරුව මුදා හැරීමට කටයුතු කළ බවට වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත.

අදාළ මංකොල්ලකෑමේ සිද්ධිය සම්බන්ධයෙන් බල අපරාධ 617/16 යටතේ 2016.12.31 දින පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර, මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු කෙරෙහි සැකයක් පවතින බවට එහි සඳහන් වී නොමැති බව තවදුරටත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් පහරදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ඔවුන් වෙත ඉදිරිපත් කර ඇති චෝදනා ප්‍රතික්ෂේප කර ඇත.

4 සහ 5 වන වගඋත්තරකරුවන් මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට සහභාගි නොවූ බවට සඳහන් කර ඇත. අදාළ අත්අඩංගුවට ගැනීමේ තොරතුරු සටහන් පොත් වල ද එම නිලධාරින් අත්අඩංගුවට ගැනීමට සහභාගි වූ බවට සඳහන් වී නොමැත. නමුත්, පැමිණිලිකරු 2020.02.17 දින පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ

කර ඇත්තේ, පො.සැ.19433 උපාලි නිලධාරියා සහ පො.කො.60181 ආනන්ද නිලධාරියා තමාව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සිටි බවත්, වෙනත් නිවසකට රැගෙන ගොස් පහර දෙන අවස්ථාවේදී ද මෙම නිලධාරින් දෙදෙනා සිටි බවත්, ඔවුන් දෙදෙනා විසින් ද තමාට පහරදුන් බවත්ය.

නමුත්, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයේදී ද අනෙක් නිලධාරින්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට නිර්දේශ කර ඇතත්, 4 සහ 5 වගඋත්තරකාර නිලධාරින් දෙදෙනාට විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර නොමැත. එසේම පැමිණිල්ලේ වෙනත් සාක්ෂි මගින් ද ඒ බව තහවුරු කර නොමැත.

**නිගමනය :**

පැමිණිලිකරු රියදුරෙක් වශයෙන් සේවය කරන නිවසේ මුදල් සහ රන් අභරණ මංකොල්ලයක් සිදුවී ඇති අතර, ඒ සම්බන්ධයෙන් එම නිවෙස් හිමිකාරිය විසින් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කර ඇත. එම පැමිණිල්ලෙන් ද මෙම ආනන්ද බාබු යන අය සම්බන්ධයෙන් සැකයක් පවතින බවට සඳහන් වී නොමැත.

කෙසේ වෙතත්, පොලිසියට ලැබී ඇති පැමිණිල්ලේ පැමිණිලිකාරිය වාචිකව මෙම වින්දිත තැනැත්තා සම්බන්ධයෙන් සැකයක් පවතින බවට ලබාදුන් තොරතුර පිළිබඳව දුරකථන විශ්ලේෂණ වාර්තා වැනි විමර්ශන ක්‍රියාමාර්ග තුළින් තහවුරු කර ගැනීමට හැකියාව තිබියදී, එසේ නොකර හුදු සැකය මත පමණක් නිසි විමර්ශනයකින් තොරව මෙම පැමිණිලිකාර ආනන්ද බාබු යන අය අත්අඩංගුවට ගෙන ඇති බව පෙනියන අතර, අධිකරණ වෛද්‍ය වාර්තා අනුව බරපතල නොවන තුවාල තුනක් ඇති බව දක්වා ඇත. අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කිරීමෙන් පසු පැමිණිලිකරු විසින් රෝග ඉතිහාසය සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයේ දී ඔහුට පහරදුන් ආකාරය දක්වා ඇති අතර, ඔහුගේ මුහුණට සහ පිටට පහරදුන් බවත්, අත් පිටුපසට කර ගැට ගැසූ බවත්, අත් දෙක ගැට ගැසීමෙන් පසු එල්ලූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව වෛද්‍ය වාර්තාවේ තුවාල සිදුවී ඇති ස්ථාන සහ එම තුවාල සිදුවූ ආකාරය පිළිබඳව පැමිණිල්ලේ දක්වන කරුණු හා සැසඳෙන බැවින් පහරදීමක් සිදුව ඇති බවට කරුණු අනාවරණය වේ.

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති ආකාරයට යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත යුත්තේ නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටියට අනුව වන අතර, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වන වගන්තිය අනුව ද සංඥය වරදක් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගත යුතු ආකාරය පැහැදිලිව දක්වා ඇත. එසේම, හුදු සැකයක් මතම පුද්ගලයෙකු අත්අඩංගුවට නොගත යුතු බවත්, විමර්ශන නිලධාරින් විසින් පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද පසු එකී කාරණා විමර්ශනයකින් තහවුරු කර ගැනීමෙන් පසුව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතුය.

<u>**වෙලුමුරුගේසු එදිරිව නීතිපතිවරයා සහ තවත් අය (1981) 1 SLR 406**</u> නඩුවේදී වනසුන්දර විනිසුරුතුමන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළ නිර්දේශය දක්වා ඇති අතර, වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව 11 වන ව්‍යවස්ථාව වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් දක්වා ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක් ද අවශ්‍ය වන බැවින්, මෙම 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම්හි වැදගත්කම තවදුරටත් සුවිශේෂීත්වයක් පෙන්නුම් කරයි.

<u>**අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු (1987) 2 SLR 119**</u> නඩුවේදී දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද, කිසියම්

අවස්ථාගත කරුණක් යටතේ වුවද එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

ඉහත කරුණු සියල්ල කෙරෙහි සමස්තයක් ලෙස සලකා බැලීමේදී පෙනීයන්නේ වින්දිත පුද්ගලයා සම්බන්ධයෙන් හුදු සැකයක් මත එය තහවුරු කර ගැනීමකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බැවින්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවයි.

තවද, අධිකරණ වෛද්‍යවරයාගේ වාර්තාව අනුව පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වන බැවින්, 11 වන ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත්තේ අමානුෂික, කෲර හා අවමන් සහගත සැලකිල්ලට හෝ දඬුවමකට භාජනය නොවීමට වින්දිත පුද්ගලයාට ඇති අයිතිය ද 1 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට තවදුරටත් මෙයින් නිගමන කරනු ලැබේ.

ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.

1. 1 සහ 3 වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් විසි පන්දහස (රු. 25,000/-) බැගින් රුපියල් පනස් දහසක (රු. 50,000/-) මුදලක් පැමිණිලිකරු වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

2. 1 සහ 3 වගඋත්තරකරුවන්ගේ නීත්‍යානුකූල නොවන ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති විසින් පියවර ගත යුතුය.

3. 4 සහ 5 වන වගඋත්තරකරුවන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් සිදුකර ඇති බවට සාක්ෂි මගින් තහවුරු නොවීම මත එම නිලධාරීන් දෙදෙනා මෙම වගකීමෙන් බැහැර කළ යුතු වේ.

2025. 09 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
පොලිස් මූලස්ථානය, කොළඹ.

සැ.යු. - අදාළ මුදල්, මුදල් ඇණවුමක් මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන්න.

ස/-